# ලංසු සඳහා ආරාධනය

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

# අනුරාධපුරය

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය මගින් පහත වගුවෙහි සඳහන් ව්‍යාපෘතීන් සඳහා සුදුසුකම් හා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු කැඳවීම (NCB) යටතේ සිදු කරනු ලැබේ.

| අනුඅංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ඇස්තමේන්තු වටිනාකම (රුපියල් මිලියන) | CIDA ශ්‍රේණිය | කොන්ත්‍රාත් කාල සීමාව (දින) | ලංසු සුරක්ෂණය | | ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලේඛන ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | වටිනාකම (රුපියල්) | වලංගු විය යුතු කාල සීමාව | |
| 01 | **NCP/PRDA/RR/2026/9** | 365 මන්නාරම හන්දිය සංවර්ධනය කිරීම. | මහවිලච්චිය | 8.46 | C8, C7 හෝ C6 (මහාමාර්ග) | 60 | 126,850.00 | 2026/12/15 | 3,900.00 |
| 02 | **NCP/PRDA/RR/2026/10** | හල්මිල්ලකුලම වැව් බැම්මේ සිට ඕලු වැව හරහා අමුණුකොලේ වැව් බැම්ම මතින් දොම්පේ කඩේ දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීම. | නොච්චියාගම | 6.63 | C8, C7 හෝ C6 (මහාමාර්ග) | 60 | 99,400.00 | 2026/12/15 | 3,300.00 |
| 03 | **NCP/PRDA/RR/2026/01** | ඩී 10 මෛත්‍රීපුර ගයාන් වෙළඳ සැල අසල සිට ඩී 10 මංසන්ධිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | පදවිය | 2.92 | C9, C8 හෝ C7 (මහාමාර්ග) | 60 | 43,800.00 | 2026/11/17 | 2,000.00 |
| 04 | **NCP/PRDA/RR/2026/02** | කැබිතිගොල්ලෑව ඩිපෝව අසලින් ආරම්භ වී ජයනෙතුගම දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම. | කැබිතිගොල්ලෑව | 6.02 | C8, C7 හෝ C6 (මහාමාර්ග) | 60 | 90,250.00 | 2026/12/15 | 3,100.00 |
| 05 | **NCP/PRDA/RR/2026/03** | මැදවච්චිය - හොරොව්පොතාන මාර්ගයේ 3 කණුව හන්දියේ සිට ලේනදිවුල්වැවදක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම | මැදවච්චිය | 12.72 | C7, C6 හෝ C5 (මහාමාර්ග) | 60 | 190,750.00 | 2026/12/15 | 5,250.00 |
| 06 | **NCP/PRDA/RR/2026/04** | දිවියා උඩබැන්දවැව හන්දියේ සිට කඩහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | රඹෑව | 12.90 | C7, C6 හෝ C5 (මහාමාර්ග) | 60 | 193,500.00 | 2026/12/15 | 5,300.00 |
| 07 | **NCP/PRDA/RR/2026/17** | කට්ටමුරිච්චාන පාසල අසල සිට මීවැල්ලෑව දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. | තිරප්පනේ | 34.57 | C6, C5 හෝ C4 (මහාමාර්ග) | 90 | 518,600.00 | 2026/12/29 | 12,250.00 |
| 08 | **NCP/PRDA/RR/2026/19** | හොරිවිල ටී.බී.එස්. අමරසිංහ මහතාගේ වෙළඳසැල අසල සිට හොරිවිල විහාරස්ථානය දක්වා මාර්ගය පැති කාණු හා බෝක්කු සහිතව සංවර්ධනය කිරීම | පලුගස්වැව | 13.30 | C7, C6 හෝ C5 (මහාමාර්ග) | 60 | 199,600.00 | 2026/12/15 | 5,450.00 |
| 09 | **NCP/PRDA/RR/2026/22** | උළුක්කුලම හන්දියේ සිට වීරවැව දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිම | මනුප | 14.00 | C7, C6 හෝ C5 (මහාමාර්ග) | 60 | 210,000.00 | 2026/12/15 | 5,650.00 |
| 10 | **NCP/PRDA/RR/2026/06** | ගලෙන්බිදුණුවැව අනුරාධපුර ප්‍රධාන මාර්ගයේ සිට පොලිස් ස්ථානය හා සති පොළ අසලින් මධ්‍ය විද්‍යාල මාවත ඇල බැම්ම දක්වා මාර්ගය සංවර්ධනය කිරිම | ගලෙන්බිදුණුවැව | 42.55 | C6, C5 හෝ C4 (මහාමාර්ග) | 90 | 638,200.00 | 2026/12/29 | 14,000.00 |
| 11 | **NCP/PRDA/RR/2026/07** | කලෑනිකවැව ගම්මානයේ මංසන්ධියේ සිට දහනක් වැව දක්වා මාර්ගය බෝක්කු සහිතව සංවර්ධනය කිරිම | කහටගස්දිගිලිය | 6.79 | C8, C7 හෝ C6 (මහාමාර්ග) | 60 | 101,900.00 | 2026/12/15 | 3,350.00 |
| 12 | **NCP/PRDA/RR/2026/21** | අනුරාධපුර කුරුණෑගල මාර්ගයේ පත්තර කඩේ හන්දියෙන් සහ ආතර් සිල්වා මාවතින් ආරම්භ වී කොඩිගලගම හරහා යෝධ ඇල සහ සුදර්ශනගම දක්වා මාර්ගය සංවර්ධනය කිරිම | නාච්චාදූව | 13.51 | C7, C6 හෝ C5 (මහාමාර්ග) | 60 | 202,650.00 | 2026/12/15 | 5,500.00 |

2. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු අසාදු ලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය විසින් ඌණ කාර්ය සාධනය හේතු කොටගෙන මීට පෙර ගිවිසුම අවසන් කරන ලද කොන්ත්‍රාත්කරුවකු නොවිය යුතුය. (Should not be Terminated due to the poor performance).

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසු ලේඛනයෙහි **4** පරිච්ඡේදයේ(section 4) සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය (දු.ක. 025-2222233/34) වෙතින් වැඩිදුර විස්තර ලබා ගත හැකි අතර, ගාස්තු ගෙවීමකින් තොරව එම කාර්යාලයේදී **2026.08.13** වන දින සිට **2026.08.31** වන දින දක්වා වැඩකරන දිනවල දී පෙ.ව. 9.00 ත් ප.ව.3.00 ත් අතර ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

5. ඉහත වගුවේ සඳහන් ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලේඛන ගාස්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරයහි ගිණුම් අංශයට ගෙවීමෙන් හෝ ලංකා බැංකුව අනුරාධපුර ශාඛාවේ "දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය" නමින් ඇති නිල බැංකු ගිණුම් අංක 7042174 දරණ ගිණුමට බැර කර තැන්පතු පත්‍රිකාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරයහි ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2026.08.13** වන දින සිට **2026.08.31** වන දින දක්වා වැඩකරන දිනවල දී පෙ.ව. 9.00 ත් ප.ව.3.00 ත් අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් ලබා ගත හැකිය.

6. ලංසු ඉදිරිපත් කිරීමේදී සෑම ලංසුවක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන් වෙන්ව කවරවල බහා නැවත එම කවර දෙකම එක් කවරයක බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවර ව්‍යාපෘතියේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර **2026.09.01** වන දින පෙ.ව. 11.00 ට පෙර "දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකිය. **2026.09.01** වන දින පෙ.ව. 11.00 ට ලංසු භාර ගැනීම අවසන් වූ විගසම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සෑම ලංසුවක් සමඟම එක් එක් ව්‍යාපෘතියට අදාළව ඉහත වගුවේ සඳහන් වටිනාකමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය"** නමින් ප්‍රසම්පාදන ලේඛනවල අන්තර්ගත ආකෘතිය අනුව පමණක් ලබා ගත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිනම් ලංකා බැංකුව අනුරාධපුර ශාඛාවේ, **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය"** නමින් ඇති නිල බැංකු ගිණුම් අංක **7042174** දරණ ගිණුමට ලංසු සුරක්ෂණයේ වටිනාකම බැර කර තැන්පතු පත්‍රිකාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරයහි ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා එන්.සී 100 කුවිතාන්සියේ මුල් පිටපත ප්‍රසම්පාදන ලේඛනයට අමුණා ඉදිරිපත් කල යුතුය. එසේත් නොමැතිනම් ඉහත වගුවේ සඳහන් වටිනාකමට ඉදිකිරීම් ඇපකර අරමුදල විසින් නිකුත් කරන ලද, කොන්දේසි රහිත සහ ඉල්ලීම මත ගෙවිය හැකි ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය .නොඑසේ නම් අදාළ මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය ගිණුම් අංශය වෙත භාරදී ලබාගත් ලදු පතේ මුල්පිටපත සමග අමුණා ඉදිරිපත් කළ යුතුයි.ලංසු සුරක්ෂණය ඉහත වගුවේ සඳහන් දින **දක්වා වලංගු විය යුතුය.**

8. පූර්ව ප්‍රසම්පාදන රැස්වීම **2026.08.21** වන දින පෙ.ව.11.00 ට පහත ලිපිනයේ ඇති පත්‍රිකාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය කාර්යාලයේදී පැවැත්වේ.

9. මෙම ප්‍රසම්පාදනය පිළිබඳව අවසාන තීරණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරයහි ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**සභාපති/ දිස්ත්‍රික් ලේකම්,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**අනුරාධපුරය**
**දුරකථන අංකය : 025 – 2222233/34**